# ප්‍රතිපත්ති ප්‍රකාශනය

## මහ මැතිවරණය 2020

එක්සත් ජාතික පක්ෂය

එක්සත් ජාතික පක්ෂය

# පාර්ලිමේන්තු මැතිවරණයට ඇත්තේ තව සති කිහිපයකි.

ගෙදරදොර අගහිගකම් ය. මග තොට අපහසුකම් ය. රැකියාවේ හා ආදායම් මාර්ගයන් හී අඩුළුහුඩුකම් දවසේ වේල සරිකරගන්නා පුද්ගලයාගේ පටන්, මහා පරිමාණ ව්‍යාපාරිකයා දක්වා දැඩි ආර්ථික පීඩනයකට පත් වී තිබේ.

පාලකයින් කොරෝනා වසංගතය පිට දමා මේ ව්‍යසනයෙන් සැගවීමේ වෑයමක ය.

සැබැවින් ම කියනවානම් සිදු වූයේ අනෙකකි. මේ ආණ්ඩුවේ අදූරදර්ශී මූල්‍ය කළමණාකරනය නිසා ආර්ථිකය කඩා වැටෙමින් තිබිණි. ගඟෙන් වැටෙමින් තිබූ ආර්ථිකයට ගොනා ඇන්නේ කොරෝනා වසංගතය සමගය.

# අවුලේ සුලමුල

කරපිංචා කොලයේ සිට සුබෝපභෝගී විද්‍යුත් උපාංගය දක්වා සියළු පාරිභෝගික  භාණ්ඩ වල මිල ඉහළ ගොසිණි. පවුලේ බඩගින්න නිවාගත නොහැකි තරමට  කුස්සිය හිස් වී ගොසිනි. සේවක පඩිනඩි ගෙවා ගත නොහැකි තරමට ආයතන  අඩපණ වී ගොසිනි.

රාජ්‍ය අංශයේ සේවක සේවිකාවන්ගේ දීමනා කප්පාදු වෙමින් පවති. අලුත් අවුරුදු  උත්සව අත්තිකරම් පවා ඔවුනට ලැබුනේ නැත. පුද්ගලික අංශයේ සේවක  සේවිකාවන්ගේ  දීමනා කප්පාදු  වී  ගොසිණි. බොහෝ ආයතන වලට  සම්පූර්ණ වැටුප් ගෙවාගැනීමට ශක්තියක් නොමැත.

කර්මාන්ත අකර්මන්‍ය වී ගොසිනි. ආනයන තහංචි නිසා ව්‍යාපාර සහ ආයතන ගණනාවක් ඇද වැටී ගොසිනි. ස්වයං රැකියා බරපතල අනතුරකය. මැදපෙරදිග රැකියා දහස් ගණනාවක් අහිමි වෙමින් පවතී. කෘෂිකර්ම හා වෙනත් සේවාවන්හී නිරත වූවන්ගේ ආදායම් පහත වැටෙමින් යයි. සංචාරක කෙෂ්ත්‍රය යළි කවදා ගොඩ නැංවිය හැකිදැයි යන්න පිළිබඳ අනාවැකියක් හෝ කිව නොහැකිය. ප්‍රධාන අපනයන වෙළඳපොළ අහිමි වී ගොසිනි.

මේ නිසා විදේශ ආදායම් මාර්ග සියල්ලම පාහේ වැසී යමින් පවති.

# අවුලෙන් අවුලට

කෙටියෙන් සඳහන් කළහොත් මුළු රටේම ආර්ථිකය අනතුරුදායක ප්‍රපාතයක් වෙත ඇද වැටෙමින් පවති.

මේ සියල්ලෙහි අගතිගාමී ප්‍රතිඵළ ලෙස ජීවන වියදම දරාගත නොහැකි මට්ටමකින් ඉහළ නැංවෙමින් පවතී.

අතමිට හිග ය. ඒක පුද්ගල ආදායම් මට්ටම පහළ වැටෙමින් පවතී.

2021 වන විට මිලියනයකට වඩා ප්‍රමාණයකට රැකියා අහිමි වනු ඇතැයි පුරෝකථනය කර තිබේ. මැදපෙරදිග රැකියා අහිමි වන ප්‍රමාණය ද මීට එක් වූ විට අනතුරුදායී තලයකට ඉහළ නැංවෙනු ඇත.

විදේශ විනිමය සංචිත දිය වෙමින් පවතී.

මේ අවුල විසඳීමට කියා රුපියල් බිලියන 450 ක මුදල් නෝට්ටු දේශීය ආර්ථිකයට මුදා හැරීමට පාලකයින් කටයුතු කිරීමේ ප්‍රතිඵලය වී ඇත්තේ අවුල තවත් වියවුලක් බවට පත් වීමය.

# අවුල ලිහීම

මේ අවුලෙන් අප රටක් ලෙස ගොඩ ආ යුතු ය. අවුල ලිහා ගත යුතු ය. ඊට පැලැස්තර විසඳුම් හෝ කෙටි මාර්ග නොමැත.

මේ අනතුරුදායක තත්වයෙන් ගොඩ ඒමට නම් දීර්ඝකාලීන පරිපූර්ණ ආර්ථික සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතු බව රනිල් වික්‍රමසිංහ මහතා අවස්ථා ගණනාවක දී පාලකයන්ට පෙන්වා දුන්නේ ය ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන බව ද ප්‍රකාශ කළේය

එවැනි පසුබිමක පවා පරිපූර්ණ ආර්ථික සැලසුමක් සම්පාදනය කර ගැනීමට පාලකයන්ට හැකි වූයේ නැත.

ඒ ඇයි..?

ඔවුන්ට නිවැරදි ආර්ථික දැක්මක් නැත ආර්ථිකය යළි නැංවීමේ ක්‍රමෝපායන් පිළිබඳ අදහස් නැත ජාත්‍යන්තර ආර්ථික අභියෝගයන්ට මුහුණ දෙමින් දේශීය ආර්ථිකය ගොඩ නැංවීමට ශක්තියක් නොමැත මේ බව දැන් ඔවුන් ජනතාව ඉදිරියේ ඔප්පු කර හමාරයි ඉදිරිය මීටත් වඩා භයානකය

# අවුල ලිහමු

නිදහසින් පසු මෙරට මුහුණ දෙන දැවැන්තම ආර්ථික අර්බුදයට අපි මැදිව ඇත්තෙමු මේ ආර්ථික අවුල ලිහා, අර්බුදය විසඳීමේ දැක්මක්, සැලසුමක් හා ශක්තියක් ඇත්තේ එක්සත් ජාතික පක්ෂයට පමණි

අයහපත් කළමණාකරනය නිසා දේශයේ ආර්ථිකය කඩා වැටුනු 1977, 2001, 2015 වසර වල දීත්, පාස්කු බෝම්බය නිසා ආර්ථිකය අඩපණ වුනු 2019 වසරේදීත් යළි ආර්ථිකය ඉහලට ඔසවා තැබුවේ එක්සත් ජාතික පක්ෂයයි

අප මේ ඔබ වෙත ඉදිරිපත් කරනුයේ මේ කඩා වැටෙන ආර්ථිකය යළි පන ගන්වා, සමස්ථ සමාජය ශක්තිමත් කරලීම පිළිබඳ අප ඔබ වෙත ඉදිරිපත් කරන සැලැස්ම පිළිබඳ කෙටි සටහනකි. එය විමසිල්ලෙන් කියවන්න

ඒ සැලැස්ම මගින්, ඔබට, ඔබේ දූ දරුවන්ට, ඔබේ නිවෙසට, ඔබේ රැකියාවට, ඔබේ ආයතනයට, ඔබේ ව්‍යාපාරයට, ඔබේ ආර්ථිකයට ශක්තියක්, ජීවයක්, ආලෝකයක් ලැබේයැයි හැගෙන්නේ නම්, එක්සත් ජාතික පක්ෂය හා එක්වී ඔබේ ජීවිතය සුරක්ෂිත කරගන්න

# අවුල ලිහා දැමීම

අපේ ආර්ථිකය යළි පන ගැන්වීමේ දී අංශ කිහිපයක් පිළිබඳව මුලික අවධානය යොමු කළ යුතුය. කොරෝනා වසංගතය නිසා බිඳ වැටුනු ලෝක හා දේශීය ආර්ථිකය එක් අංශයකි. දේශීය ආර්ථිකය නගා සිටුවීමේ සැලසුම් සකස් කළ යුත්තේ මේ පසුබිම සැලකිල්ලට ගෙන ය.

කොරොනා දෙවන රැල්ලක් රට තුළ පැතිර යාම වැළැක්වීම සම්බන්ධව පූර්ණ අවධානය අප යොමු කළ යුතුය. එවැනි රැල්ලක් පැතිරීමේ ප්‍රතිඵලය වන්නේ ආර්ථිකය නැවත පසුබෑමකට ලක් වීමය.

ජාත්‍යන්තර සහයෝගය දිනාගත යුතුය. හුදෙකලා රාජ්‍යයක් ලෙස මේ සටන ජයගත නොහැකිය.

ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා මිනිස් නිදහස සියයට සියයක්ම සුරක්ෂිත කළ යුතුය.

අනාගත පරම්පරාව නවීන දැනුමින් සන්නද්ධ කළ යුතුය. ඔවුන්ගේ දැනුම රට නැංවීමේ ක්‍රියාවලිය සඳහා උපයෝගි කර ගත හැක්කේ එවිටය

**ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කරමින් එක්සත්, එක්සිත් හා සමගි සම්පන්න ජාතියක් නිර්මාණය කළ යුතුය.බෙදී ගිය ජාතියක් හා රටක් නොව අපට අවශ්‍ය එක්සත් ජාතියක් හා ඒකීය රටකි.**

# අවුල ලිහා දැමීමේ මාර්ගය

අද අප පත්ව ඉන්නා සැබෑ තත්වය මුලින්ම අවබෝධ කර ගත යුතුය.රෝගය හරිහැටි හඳුනා නොගෙන ලබා දෙන බෙිත් හේත් වලින් සුවයක් ලැබිය නොහැකිය.

විදේශ ආදායම් හරහා රටට ලැබෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 7000ක පමණ ආදායමක් මේ වසරේදී අපට අහිමි වී යනු ඇත. ණය සහ සේවාවන් සඳහා මේ වසරේ ගෙවිය යුතු මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 3000 කි.

මේ නිසා ඉදිරි වසර දෙක තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 6000 ක් දේශීය ආර්ථිකයට කාන්දු කරලීමට අවශ්‍ය බව එක්සත් ජාතික පක්ෂය ගණන් බලා තිබේ. ලබන වසර තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 3000 ක අවමයක් අවශ්‍ය වනු ඇත.

ලෝකයේ බොහෝ රටවල් ජාත්‍යන්තර සහයෝගය ඔස්සේ මේ ආකාරයෙන් තම තමන්ගේ රටවල ආර්ථික යළි පණ ගැන්වීමට අවශ්‍ය මුදල් ප්‍රතිපදාන සලසා ගෙන හමාරය.

පකිස්ථානය, නේපාලය, බංගලාදේශය, මියන්මාරය, ඇෆ්ඝනිස්තානය, මාලදිවයින, ඊජිප්තුව සහ කෙන්යාව ආදී රටවල් මේ වන විටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් සහය ලබා ගැනීම ඊට උදාහරණ සේ පෙන්වා දිය හැකිය.

නමුත් ශ්‍රී ලංකාවට කිසිඳු ජාත්‍යාන්තර සහයක් ලබා ගැනීමට මෙතෙක් නොහැකි වී තිබේ.රට කරවන පාලකයන්ට ආර්ථික දැක්මක් හෝ සැලැස්මක් නොමැති වීම නිසාත්,අදූරදර්ශී පාලන ක්‍රමවේදයන් නිසාත් අප ජාත්‍යන්තරයෙන් හුදෙකලා වී ගොසිනි.

ආර්ථිකය යළි පනගැන්වීම උදෙසා ජාත්‍යන්තර සහයෝගය හා දේශීය පදනම ඔස්සේ මේ සා මුදලක් සොයා ගැනීමේ ශක්තිය ඇත්තේ එක්සත් ජාතික පක්ෂයට පමණි.

- අප බලාපොරොත්තු වන්නේ ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල හා වෙනත් මාර්ග ඔස්සේ ඇමෙරිකානු ඩොලර් මිලියන 6000 ක මුදල් සොයා ගැනීමටය.

- වත්මන් පාලකයන්ගේ මුරණ්ඩු ක්‍රියා කලාපයන් නිසා ජපානය හා ජයිකා ආයතනය සමගි සබදතා බිඳ වැටී ගොසිනි.අපගේ මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තිය හරහා මේ සබඳතා යළි තහවුරු කරන්නෙමු.

- ආර්ථිකය යළි නංවාලීමේ සැලසුම ඔස්සේ අප තැත් දරනුයේ ජපානය මෙන් වඩාත් තරඟකාරී පදනමක් සැකසීමටය. තරඟකාරී ව්‍යාපාර ශක්තිමත් කොට නව පන්නයේ කර්මාන්ත හා සේවාවන් පුළුල් කරලීමටය.

අප ලබාගෙන ඇති ණය ගෙවිය හැකි ශක්තිමත් ආරථිකයක් නිර්මාණය කර ගත හැක්කේ එවිටය.

# අවුල ලිහීමේ සැලසුම

ආර්ථික අර්බුධයෙන් පීඩා විඳින ජනතාව ඉන් මුදවා ගැනීම උදෙසා ඔවුන්ගේ අතමිට සරු කළ යුතුය.රැකියා සුරක්ෂිත කළ යුතුය. ස්වයං රැකියා ආදායම් ආරක්ෂා කර ගත යුතුය. රැකියා අහිමි වුවන් රැක බලා ගත යුතුය. ඊට සමාන්තරව නව රැකියා ආදායම් මාර්ග නිර්මාණය කළ යුතුය.

- කොවිඩ් 19 වසංගතයේ අතුරුඵල ලෙස මිලියනයකටත් වඩා වැඩි ප්‍රමාණයකට රැකියා අහිමි වන බව ගණන් බලා තිබේ. මෑතකදී රැකියා අහිමි වූ සෑම කෙනෙකුටම රුපියල් 10000 ක මාසික දීමනාවක් ලබා දෙන්නෙමු. විදේශ රැකියා අහිමි මෙරටට පැමිණෙන අයටද මේ සහනය හිමි වනු ඇත.

- රාජ්‍ය සේවයේ අත්හිටුවා ඇති සියළු දීමනා යළි ලබා දෙන්නෙමු.

- එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා යෝජනා ක්‍රමය යටතේ මිලියන 50 කට වඩා අඩු ණය ලබා ඇති සියළුදෙනාට ණය ගෙවීම් සඳහා සහන කාලයක් ලබා දෙන්නෙමු.

- සමාජ අගලු දැමීම් හේතුවෙන් පීඩාවට පත් අසරණ පවුල් වෙත රුපියල් 10000 ක දීමනාවක් පිරිනමන්නෙමු.

- ශ්‍රී ලංකාවේ සියළු ව්‍යවසාය ආරක්ෂා කරන්නෙමු.

ඒ සඳහා,

ජගත් වෙළඳ ද්‍රවශීල වැඩසටහන හා අවදානම් මූල්‍ය වැඩසටහන ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව මගින් පුද්ගලික අංශ වෙත ලබා දෙන අරමුදල් ලබා ගන්නෙමු.

කොවිඩ් 19 ආසියානු සංවර්ධන බැංකුවේ ඇමෙරිකානු ඩොලර් බිලියන 20 ක සහනාධාර වැඩසටහන, එවැනි සමාන්තර වැඩසටහන් ඔස්සේ සහය ලබා ගැනීමට අමතරව රජය මගින් ද පුද්ගලික ව්‍යාපාර සඳහා සහය දැක්වීමේ වැඩ සැලැස්මක් ක්‍රියාත්මක කරන්නෙමු.

මේ අරමුදල් හා වැඩ සැලසුම් ඔස්සේ සුළු හා මධ්‍යම ව්‍යවසායන්, කුඩා ව්‍යවසායන් සහ ස්වයං රැකියා ව්‍යවසාය ශක්තිමත් කරන්නෙමු. ඒ සඳහා මූල්‍ය ආධාර සහ ගනුදෙනු කිරීමට වලංගු දීර්ඝ කාලීන රාජ්‍ය බැඳුම්කර එම ව්‍යවසායකයින් වෙත ලබා දෙන්නෙමු.

- පුද්ගලික අංශයේ වැටුප් ගෙවීම් සඳහා මෙමගින් සහය ලබා ගත හැකිය.

- අපනයන කර්මාන්ත සඳහා ලබා දෙන සහයද මේ ක්‍රමවේදයට ඇතුළත්ය. ගිලිහී ගිය ජාත්‍යන්තර වෙළඳපොළ යළි ජය ගැනීම උදෙසා විශේෂ පැකේජ හඳුන්වා දෙනු ලැබේ. ගැණුම්කරුවන්ගේ කොන්දේසි සපුරාලීම සඳහා ද, නව වෙළඳපොළ සොයා ගැනීම සඳහා ද සහය ලබා දෙනු ඇත.

- සංචාරක කෙෂ්ත්‍රයේ හෝටල, පුද්ගලික නිවාස කාමර, අවන්හල් හා ස්වයං රැකියා පවත්වාගෙන යන පුද්ගලයන් හා ව්‍යවසායකයන් ශක්තිමත් කරලීමේ පැකේජයක් හඳුන්වා දෙනු ලැබේ. සංචාරක

වෙළඳපොළට යළි පිවිසීමට, සේවක සේවිකාවන් ප්‍රතිපුහුණුවට ලක් කිරීමට හා ව්‍යවසායන්ගේ තත්වය වඩාත් ඉහළ නැංවීමට මෙමගින් අනුබල ලබා ගත හැකිය.

- ත්‍රීරෝද රථ හිමිකරුවන්ට ලීසිං සමාගම් වෙත ණය ගෙවීම සඳහා සහන කාලයක් ලබාදෙනු ඇත.

- එමෙන්ම ත්‍රීරෝද රථ හිමිකරුවන්ට මෝටර් රථ මිලදී ගැනීම සඳහා සහනදායී ණය ලබා දීමට සැලසම් කර තිබේ.

- කොවිඩ් 19 නිසා අගතියට පත් ව්‍යාපාර බංකලොත් භාවයට පත්වීම වැළක්වීමට අවශ්‍ය නව නීති රීති සම්පාදානය කෙරෙණු ඇත.

- රජය විසින් ලබා ගත් සියළුම සේවාවන් සහ කොන්ත්‍රාත් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල් වහාම ගෙවීම ඔස්සේ මුදල් සංසරණය ප්‍රසාරණය කෙරේ.

අප හැමවිටම උත්සාහ දරන්නේ දේශීය ආර්ථිකය ජාත්‍යන්තර තලයට ඔසවා තැබීමටය. ලාංකේය ව්‍යවසාය, කර්මාන්ත හා නිෂ්පාදන ලෝක මට්ටමට ගෙන ඒමේ ක්‍රමික සැලැස්ම අපි ක්‍රියාවට නංවන්නෙමු.

නව රැකියා සහ ආදායම් මාර්ග බිහිකරලීම උදෙසා බිංගිරිය 2 හා රුහුණු නිදහස් වෙළඳ කලාප පිහිටු වන්නෙමු. මේ වෙළඳ කලාපයන්හි ජපානය, ඉන්දියාව, චීනය වැනි දැවැන්ත නිෂ්පාදන කර්මාන්ත රාජ්‍යයන් සඳහා සුවිශේෂී ලෙස වෙන්කර දීම අපේ අපේක්ෂාවයි.

- නවීන පහසුකමින් යුතු සංචාරක කලාප දෙකක් ස්ථාපිත කරන්නෙමු.

- තොරතුරු තාක්‍ෂණ කර්මාන්තය නංවා ලන්නෙමු. තොරතුරු තාක්‍ෂණය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපොළ දිනා ගන්නෙමු. අද්විතීය නිෂ්පාදන වෙළඳපොළට නිර්මාණය කරන ආයතන සඳහා විශේෂ මූල්‍ය පහසුකම් සපයන්නෙමු. එවැනි ආයතන සඳහා සහනදායී හා දර්ඝ කාලින ණය ලබා දෙන්නෙමු. විදේශ වෙළඳපල ඉලක්ක කරගත් තොරතුරු තාක්ෂණික සමාගම් වලට රජයේ ව්‍යාපෘති සදහා අයදුම් කිරීමට ඉඩ සලසන්නෙමු.

- අපනයන කර්මාන්ත දිරිමත් කරන්නෙමු. වත්මන් රජයේ ආනයන සීමාවන් නිසා අපනයන කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වා ගැනිම කඩා වැටී ගොසිනි. අප මේ තත්ත්වය වෙනස් කරන්නෙමු. අපනයනය සඳහා පනවා ඇති සිමාවන් ලිහිල් කරලීමටද කටයුතු කරන්නෙමු.

# හැම පුරවැසියෙකුට ම නිවෙසක්. ඉඩමක්.

රටේ සෑම පුරවැසියෙකුටම නිවාස සහ ඉඩම් අයිතිය ලබා දීම උදෙසා කඩිනම් සැලසුම් දියත් කරන්නෙමු.

- අඩු සහ මධ්‍යම අදායම් ඇති පවුල් වලට නිවාසයක හිමිකම ලබා ගැනීම උදෙසා සහනදායී පොළියට දීර්ඝ කාලින ණය ලබා දීම.

- මෙමගින් ඉදිකිරීමේ කාර්මාන්තයටද නව පණක් ලැබෙනු ඇත. අදියර දෙකකදී නිවාස ලක්‍ෂ දහයක් මේ සැලසුම යටතේ ඉදිකෙරේ.

- ඉඩම් වල සින්නක්කර අයිතිය ජනතාවට ලබාදීමේ වැඩ පිළිවෙල ඒ සම්බන්ධයෙන් ලබාදී ඇති ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට හා වත්මන් නීති රීති වලට යටත්ව ඉදිරියට ගෙන යන අතර, පසුකාලිනව නව නීති රීති සම්පාදනයටද පියවර ගැනේ.

# කෘෂි හා ධීවර විප්ලවය

දේශීය කෘෂි කර්මාන්තය අප සංවර්ධනය කරනුයේ ජාත්‍යන්තර හා කලාපිය අවශ්‍යතාවයන් ද සැලකිල්ලට ගනිමිනි, 2050 වසර වනවිට ඉන්දීය සාගර කලාපය ආශ්‍රිතව මිලියන 500 ක අමතර ජනගහණයක් බිහිවනු ඇත. ඒ ජනගහණයට අවශ්‍ය ආහාර සම්පාදනය අපේ කෘෂි කර්මාන්ත වැඩ පිළිවෙලෙහි දීර්ඝ කාලින ඉලක්කයයි. ඒ අනුව කෘෂිකර්මාන්තය වඩාත් නවීන හා තරඟකාරී මට්ටමකට ඔසවා තැබීමට අපි පියවර ගන්නෙමු.

- අපනයන බෝග වගා කිරීම උදෙසා අක්කර මිලියනයක අලුත් වගා බිම් පිහිටුවන්නෙමු.
- ගොවියනට ලැබෙන ආදායම් ඉහල නැංවීම උදෙසා ගැමි ආර්ථිකය සවිමත් කරන්නෙමු. යාවත්කාලීන කරන්නෙමු. ග්‍රාමීය පොළ සංකල්පය වර්ධනය කරන්නෙමු. කෘෂි හා ධීවර නිෂ්පාදන සඳහා ගබඩා සහ ශීතාගාර පහසුකම් පුළුල් කරන්නෙමු.
- කෘෂි සහ ධීවර නිෂ්පාදන සැපයුම් ජාලය අත්‍යවශ්‍ය සේවාවක් සේ පවත්වා ගෙන යාමෙන් හැම විටම නිෂ්පාදකයන්ට යහපත් මිලක් තහවුරු කරන්නෙමු.
- හිඟයකින් තොරව පොහොර ලබා දීම සඳහා පියවර ගන්නෙමු.
- වී ගොවිතැනෙහි නිෂ්පාදන ඵලදායීතාව, ප්‍රමිතිය, තරඟකාරීත්වය ආරක්ෂා කරගනිමින්, සහල් අපනයනය කරා යොමු වීමට පදනම සකසන “ධාන්‍යාගාරය” වැඩ සටහන ක්‍රියාත්මක කරන්නෙමු.
- පහල මල්වතු ඔය ව්‍යාපාරය ආරම්භ කරන්නෙමු.
- ධීවර කර්මාන්තය නවීකරණය සඳහා අවශ්‍ය තාක්‍ෂණය, ආම්පන්න හා පහසුකම් ධීවරයන් වෙත ලබා දෙන්නෙමු.
- ධීවර ක්‍ෂේත්‍රය අපනයන කර්මාන්තයක් ලෙස වර්ධනය කරන්නෙමු.
- පරිසර හිතකාමී කෘෂි ව්‍යාපාරයන් වෙනුවෙන් ලෝක බැංකුව, ජගත් පරිසර පහසුව, ජාත්‍යාන්තර මුල්‍ය සහයෝගිතාව ආදී ආයතනයන් ගෙන් මුල්‍ය පහසුකම් ලබා දෙන්නෙමු.
- අක්කර බාගයේ සිට 25 දක්වා ප්‍රමාණය දක්වා කුඩා වන වගාවන් ආරම්භ කරන්නෙමු.

# ශ්‍රී ලංකාවට අනාගතයක්

එක්සත් ජාතික පක්ෂය සැම විටම කටයුතු කරනුයේ ශ්‍රී ලංකාව ඉන්දීය සාගර කලාපයේ මෙහෙයුම් කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කරලීමටය. ඒ අරමුණ ඇතිව කොළඹ කලාපීය මූල්‍ය මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා මූල්‍ය නගර පනත නීතිගත කරනු ලැබේ.

මේ අරමුණින් සකසන නව පනත් මෙසේය.

- ආර්ථික සහ මූල්‍ය (විශේෂ විධිවිධාන) පනත.
- ආර්ථික ය යළි පණ ගැනවීමේ පනත.
- සංවර්ධන පනත.
- කෘෂිකර්ම (නවීකරණ) පනත.
- ණය සහ බංකොලොත්භාවය පිළිබඳ (විශේෂ විධිවිධාන ) පනත.
- විදේශ මූල්‍ය හා සේවා පනත.

# කොරෝනා තර්ජන වැලැක්වීම

ආර්ථිකය කඩාවැටීම වලක්වා ගැනිම, යළි පණ ගැන්වීම හා නංවාලිම සඳහා පියවර ගන්නා අතරතුර අපගේ අවධානය යොමු කළ යුතු අනෙක් මූලික කරුණක් වන්නේ කොරෝනා වසංගතයේ දෙවැනි හෝ තුන්වෙනි රැල්ලක් මගින් සිදුවන ආර්ථික බලපෑම හැකි උපරිමයන් අවම කර ගැනිමයි.

- දිනකට පි.සී.ආර්. පරීක්ෂණ 5000 ක් සිදු කිරීම.
- පාසැල්, උසස් අධ්‍යාපන ආයතන සහ වෙනත් සේවාවන් සඳහා අවශ්‍ය මුඛ ආවරණ අඩු තරමින් මිලියන 10 ක් සැපයිම.
- වෙන්ටිලේටර 2000 ක් ලබා ගැනිම.
- නිරෝධායනය සහ ආරක්ෂණය සඳහා නව වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- මේ වැඩ පිළිවෙලට දායක වන සේවාවන්හි කිසිවෙකු හෝ මිය ගියහොත් යුද්ධයකදි මිය යන ආරක්ෂක අංශ සාමාජිකයන්ට මෙන් විශේෂ වන්දි මුදලක් ලබා දීම.
- පී.පී.ඊ. ඇඳුම් කට්ටල සුලබ කිරීම.
- දැඩි සත්කාර ඒකක ඇඳන් සංඛ්‍යාව ඉහල නැංවීම.
- වසංගත රෝග පර්යේෂණාගාර පිහිටු වීම.
- ජාතික සහ ප්‍රාදේශීය මට්ටමෙන් සමාජ අගුලු දැමීම් නීතිගත කෙරෙන මහජන සෞඛ්‍ය(හදිසි) පනත සම්මත කරන්නෙමු.

එක්සත් ජාතින්ගේ සංවිධානය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දී ඇත්තේ මෙවන් වසංගත ඇතිවීමට පරිසර විනාශයද එක් ප්‍රධාන හේතුවක් බවයි.

තිරසර සංවර්ධන පනත සංශෝධනය කර පරිසර ආරක්ෂණ ක්‍රමවේදයන් තව තවත් ශක්තිමත් කරන්නෙමු. අවිධිමත් කෘෂි කාර්යයන් නිසා පරිසරය විනාශ වීම වැළැක්වීමේ නීති රීති හඳුන්වා දෙන්නෙමු. දේශගුණික වෙනස්වීම් වලට හේතු වන පරිසර විනාශයන්ට තිත තබන්නෙමු.

සෞඛ්‍ය ක්ෂේත්‍රය වඩාත් ශක්තිමත් කරලීම සඳහා ද අප සැලසුම් සකස් කර ඇත්තෙමු.

- සුවසැරිය දෙවන අදියර ආරම්භ කිරීම. බස්නාහිර පළාතේ නගර ආශ්‍රිතව අනුපූරක වෛද්‍ය සේවාවක් මේ යටතේ ස්ථාපිත කෙරෙන අතර, ඔවුන්ගේ ගමන් පහසුව වෙනුවෙන් මෝටර් බයිසිකල් සපයනු ඇත.

- ගුවන් ශල්‍යාගාර සහ ගුවන් රෝහල් නිර්මාණය කෙරේ. විශාල හෙලිකොප්ටර වල මේ පහසුකම් ස්ථාපිත කෙරෙන අතර ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශයන් සඳහා ද, හදිසි අවස්ථාවන්හිදී ද ගුවන් සෞඛ්‍ය සේවාවන් ජනතාවට ලබා දෙනු ඇත.

# පාසැල් සුරක්ෂාව

අනාගතය පෝෂණය කරලීම උදෙසා පාසැල් අධ්‍යාපනය කෙරෙහි ප්‍රමුඛ සැලකිල්ලක් දැකවීම අත්‍යවශ්‍යය.

වර්තමාන අර්බුදය හමුවේ උසස් පෙළ විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් යළි සලකා බැලීම යෝග්‍ය බව අපේ අදහසයි. පාසැල් ගුරුවර වෘත්තිය සමිති ඇතුළු අදාල සියළු පාර්ශව සමග සාකච්ඡා කොට උසස් පෙළ විභාගය පැවැත්විය යුතු ආකාරය සහ කාල වකවානු පිළිබඳ තීරණය කරන්නෙමු.

පුද්ගලික අංශය සඳහා ලබා දෙන මූල්‍ය සහන සහ සහය සඳහා හිමිකම් පුද්ගලික පාසැල් සඳහා ද ලබා දෙන්නෙමු.

13 වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ටැබ් පරිඝණක ලබා දීම වහාම ක්‍රියාත්මක කරන්නෙමු.

පාසැල් නැවත ඇරඹීම සම්බන්ධයෙන් වඩාත් ප්‍රායෝගික හා ආරක්ෂිත වැඩ පිළිවෙලක් ක්‍රියාවට නංවන්නෙමු. එහිදි තාවකාලික ගොඩනැගිලි මෙන්ම, පාසැල් අවට ඇති හිස් ගොඩනැගිලි ගැනද අවධානය යොමු කෙරෙනු ඇත.

# කාන්තාවන්ගේ ශක්තිය

කාන්තාවන්ගේ ශක්තිය මීටත් වඩා පුළුල් ලෙස දේශයේ උන්නතිය වෙනුවෙන් භාවිතා කරලීමේ වැඩ පිළිවෙලක් දියත් කරන්නෙමු.

- පළාත් සභා තුළ 25% ක කාන්තා නියෝජනය තහවුරු කෙරේ.

- රාජ්‍ය ආයතන මණ්ඩල තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවීමේ පස් අවුරුදු ක්‍රියාන්විතයක් දියත් කෙරේ.

# ජාත්‍යන්තර සබඳතා

ජාත්‍යාන්තර කටයුතු, විවිධ මානයන්හි ජගත් සහයෝගීතාව, ජාත්‍යන්තර අර්බුද විසඳීම සහ කුඩා රාජ්‍යයන්ගේ ස්වෛරීත්වය ශක්තිමත් කිරීම ආදී ක්ෂේත්‍රයන්හිදි ජගත් සංවිධාන ලබා දෙන දායකත්වය තීරණාත්මකය.

මේ බව අවබෝධ කරගත් එක්සත් ජාතික පක්ෂය නිදහසින් පසු පොදු රාජ්‍ය මණ්ඩලය, එක්සත් ජාතින්ගේ සංවිධානය සහ සාර්ක් සංවිධානය ආදි විවිධ ජාත්‍යන්තර සංවිධාන සමග එක් වීමට පියවර ගත්තේය. කොළඹ ක්‍රමය, ආසියානු බල සම්මේලනය, ඇෆ්රෝ ආසියානු සමුළුව, නොබැඳි සමුළුව, එක්සත් ජාතින්ගේ සාගර සමුළුව ආදී සංවිධානයන්හි කැපී පෙනෙන කාර්ය භාරයක් ශ්‍රී ලංකාවට ඉටු කළ හැකි වූයේ ඒ නිසාය.  අප ඒ සංවිධාන සමග ඉදිරියටත් කටයුතු කළ යුතුය. ලොවෙහි කිසිඳු රටක් එක්සත් ජාතින්ගේ සංවිධානය හැර ගොස් නැත.  අපි මේ ප්‍රතිපත්තිය ඉදිරියටද ආරක්‍ෂා කරන්නෙමු.

2001 -2004 සහ 2015 - 2019 කාලය තුල අප සියළු රටවල් සමග විශිෂ්ඨ හා මිත්‍රශීලි රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පැවැත්වූයෙමු.  ඉන්දියාව, චීනය, ජපානය, දකුණු කොරියාව, වියට්නාමය, අමෙරිකාව, කැනඩාව, එක්සත් රාජධානිය ඇතුළු  යුරෝපීය රටවල්, රුසියාව, මැදපෙරදිග, සාර්ක්, බිම්ස්ටෙක් හා ආසියාන් සංවිධානයේ රටවල්, කෙන්යාව, දකුණු අප්‍රිකාව ආදිය අපේ සමීප මිතුරන් අතර සිටියහ.

ඉන්දියන් සාගරයේ ගමනාගමන නිදහස සුරැකීම සම්බන්ධයෙන් පුරෝගාමී මෙහෙවරක් කළේ අපය. ද්වීපාර්ශවික හා බහුපාර්ශවීය ගිවිසුම් ඔස්සේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය නංවාලීමේ සහය බොහෝ රටවල් වෙතින් අපි ලබාගත්තෙමු.

ඉදිරියේදි දකුණු ආසියානු හා බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල් සමග ආර්ථික සහයෝගීතාව වැඩි දියුණු කිරීමේ සැලැස්මක් ක්‍රියාවට නංවන්නෙමු.

# ප්‍රජාතන්ත්‍රවාදි පාලනය

රජයක් විසින් බලය අපහරණය කිරීමේ අවකාශය ස්වාධීන කොමිෂන් සභා ඔස්සේ දැඩි සීමාවන්ට යටත් කිරීමට අපට හැකිවිය.  මේ නිසා අධිකරණ, රාජ්‍ය පරිපාලන, පොලිස් හා මැතිවරණ යන ක්ෂේත්‍රයන්හි ස්වාධීනත්වය වඩ වඩාත් තහවුරු විණි.

අපි මේ ස්වාධීනත්වය ඉදිරියටත් ආරක්ෂා කරන්නෙමු.

ජනාධිපති ධූරයේ විධායක බලතල අහෝසි කිරීම වෙනුවෙන් තවදුරටත් පෙනී සිටින්නෙමු.

# රාජ්‍ය පාලනය

දේශපාලඥයන්, දේශපාලන පක්ෂ, පාර්ලිමේන්තු සහ ආණ්ඩුව පිළිබඳ ජනතා විශ්වාසය බිඳ වැටී ඇත. දේශපාලඥයන් ජනතාවගෙන් කෙතරම් දුරස් වී ඇතිද යත්, බහුතර ජනතාව පවසන්නේ පාර්ලිමේන්තුව නියෝජනය කරන 225 ම දියවන්නාවට ඇද දැමිය යුතු බවය. මේ බිඳී ගිය විශ්වාසය අපි යළි තහවුරු කළ යුතුය. එසේ නැති වුවහොත් ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්මක් නොමැත.

එක්සත් ජාතික පක්ෂය මේ බැව් අවබෝධ කරගෙන තිබේ. අප වෙහෙසෙන්නේ මේ තත්ත්වය නිවැරදි කරලීමටය. වසර ගණනාවක් තිස්සේ එක තැන පල් වුණු මුහුණු දැන් අපේ පක්ෂයේ නැත. අලුත් පරපුරට පක්ෂයේ අවස්ථාව උදා කර දී තිබේ. වෘත්තීයවේදීන් හා පක්ෂයේ ක්‍රියාකාරීන් රැසක් මෙවර මැතිවරණයට ඉදිරිපත් වෙති.

# යහ ප්‍රතිඵල සඳහා එක්සත් ජාතික පක්ෂය

අද බොහෝ දේශපාලඥයන් හා දේශපාලන පක්ෂ ක්‍රියා කරනුයේ වෙන්කිරීම් හා පුද්ගලික න්‍යාය පත්‍රයන් මුල් තැනට ගෙනය. කොරෝනා වසංගතයෙන් හා ආර්ථික අර්බුදයෙන් ජාතියම තර්ජනයකට ලක්ව ඇති මේ අවස්ථාවේ පවා බොහෝ පක්ෂ වෛරී දේශපාලනයක නිරත වෙති.

එක්සත් ජාතික පක්ෂය එසේ නොවේ. අපි හැම විටම රට පෙරටුව තබා කටයුතු කළ දේශප්‍රේමී පක්ෂයකි.

ඒ අතීත අත්දැකීම් සමග අපි මතු දැක්වෙන සැලසුම් ක්‍රියාත්මක කරන්නෙමු.

- 2020 පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ නායකයින් හා ජනාධිපතිතුමා ඇතුළත් සමුළුවක් මාසිකව පැවත්වීම. මේ ක්‍රියාදාමය සඳහා පදනම් කරගන්නේ බුදුන් වහන්සේ ද අනුදැන වදාල එකමුතුව වැඩකිරීමේ ලිච්චවි රාජ්‍ය පාලන සංකල්පයයි. රජයේ සියළු වැදගත් තීරණ මෙම සමුළුවේදී සාකච්ඡාවට භාජනය කෙරෙන අතර මධ්‍ය කාලීන හා දිගු කාලීන ප්‍රතිපත්තිමය රාමුවක් පිළිබඳව එකගත්වයට පැමිණෙනු ඇත.

# රාජ්‍ය පරිපාලන කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම

- රාජ්‍ය පරිපාලනය මෙහෙයවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන සේවා, තාක්ෂණික විශේෂඥ, උපදේශක හා සංස්ථා විධායක නිලධාරීන්ගෙන් සමන්විත සංවිධානයක් මගිනි.
- යුධ හමුදා කටයුතු මෙහෙයවීම වෘත්තීයමය හමුදා නිළධාරීන්ට පැවරේ.
- පොලිස් සේවයේ මෙහෙයුම් සිදු කෙරෙනුයේ ස්වාධීන පොලිස් කොමිසම මගින් පත් කරන පොලිස් නිලධාරීන් විසිනි.
- රාජ්‍ය පරිපාලන කටයුතු දේශපාලනීකරණයට හා හමුදාකරණයට නතු කිරීමට එක්සත් ජාතික පක්ෂය අවසර නොදෙනු ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ හා ඇමතිවරුන්ගේ ආචාර ධර්ම සුරැකීම උදෙසා පාර්ලිමේන්තු ප්‍රමිතිය පිළිබඳ පනත නීතිගත කරන්නෙමු. පාර්ලිමේන්තු නියෝජිතයන්ට විරුද්ධව ලැබෙන පැමිණිලි පරීක්ෂා කර බැලීම උදෙසා පාර්ලිමේන්තු ප්‍රමිතිය පිළිබඳව ස්වාධීන කොමසාරිස්වරයෙකු පත් කරන්නෙමු.

පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස දූෂණය ඉහළ නැංවී ඇති බව ජනතා මතයයි. මේ තත්ත්වය හැකිතාක් දුරට සමනය කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියා මාර්ග ගන්නෙමු.

- මනාප ක්‍රමය අහෝසි කිරීම.

- ආසන ක්‍රමය හා සාමානුපාත ක්‍රමයේ සම්මිශ්‍රණයක් ඔස්සේ මන්ත්‍රී ආසන 225 තෝරා ගැනීමේ ක්‍රමවේදයක් සැකසීම.

- මැතිවරණ සඳහා දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් සිදු කරන වියදම් පාලනය හා සීමා කිරීමේ නීති සම්මත කිරීම. මෙහිදී දැනට එවැනි නිති ක්‍රියාත්මක වන එක්සත් රාජධානිය ඇතුළු වෙනත් රටවල අණ පනත් හා අත්දැකීම් ආදර්ශයකට ගැනෙනු ඇත.

# එක මවකගෙ දරු කැල

තුන් සිංහලයේ එක්සත්කම බිඳ වැටුණේ මීට ශත වර්ෂ ගණනාවකට පෙරදීය. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජතුමන් යටතේ කෙටි කාලයකට එක්සත්ව තිබුණ ද, අන් හැම කාලයකදීම රට පාලනය වුනේ බෙදී වෙන් වුණු රාජ්‍යයක් ලෙසය.

ශ්‍රී ලංකාව යළිත් ඒකීය හා එක්සත් පාලනයකට එක් කර ගත්තේ 1948 වසරේ ඩී.එස්.සේනානායක ශ්‍රීමතානන්ගේ නායකත්වයෙන් යුතු එක්සත් ජාතික පක්ෂයයි. ඒ සඳහා පදනම ගොඩනංවාලමින් 1946 වසරේ එක්සත් ජාතික පක්ෂය බිහි කරමින් සේනානායක මහතා පෙන්වා දුන්නේ සිංහල හෝ වේවා, දෙමළ හෝ වේවා, මුස්ලිම් හෝ වේවා, මැලේ හෝ බර්ගර් හෝ වේවා මෙතැන් පටන් ශ්‍රී ලාංකේය ජාතිය යළි ආරම්භ වන බවය.

ඒ ශ්‍රී ලාංකේය අනන්‍යතාව ආරක්ෂා කිරීමට එක්සත් ජාතික පක්ෂයේ අප දිවි හිමියෙන් බැඳී සිටින්නෙමු.

ඒ පදනම මත එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ

- සියළු සත්වයන් එක හා සමාන සේ සැලකිය යුතුය යන බුදු වදන පදනමක් කර ගනිමින් නීතිය ඉදිරියේ සියලු දෙනාට සමාන ව සැලකේ.

- බුද්ධාගමට ප්‍රමුඛත්වය ලැබෙන අතර, එය ආරක්ෂා කිරීමේ සහ පෝෂණය කිරීමේ වගකීම රජය දරයි. පුරවැසියාගේ කැමැත්ත අනුව තමන්ට කැමති ආගමක් ඇදහීමේ හා පිළිපැදීමේ අයිතිය රජය විසින් ආරක්ෂා කරයි.

- තම තමන්ගේ සංස්කෘතින් පවත්වා ගෙන යෑමේ සහ පෝෂණය කිරීමේ අයිතිය පුරවැසියා සතුය.

- මානව ගරුත්වය ආරක්ෂිතය.

- ජාතික ජනවාර්ගික ගැටලුවට අපගේ විසඳුම පාර්ලිමේන්තු තේරීම් කාරකසභාවේදී සිදුකල සාකච්ඡා සහ ඉන් පිටත සිදුකල සාකච්ඡාවන්හි ප්‍රතිඵල පදනම් කරගනු ඇත.

# ඉතින් සිතා බලන්න...

එක්සත් ජාතික පක්ෂය හැර ඔබත් රටත්
ඉහළට ඔසවා තැබිය හැකි වෙනත්
පක්ෂයක් තිබේද ?

---

එක්සත් ජාතික පක්ෂය හැර ඔබත් රටත්
ආරක්ෂා කළ හැකි වෙනත් පක්ෂයක්
තිබේද?

---

එක්සත් ජාතික පක්ෂය හැර ඔබේත්,
රටේත් අනාගතය ගොඩනැංවිය හැකි
වෙනත් පක්ෂයක් තිබේද ?

## තීරණය ඔබේ අතේ...